**ශීර්ෂය 20 - මැතිවරණ කොමිෂන් සභාව**

**--------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

-------------------------------

මැතිවරණ කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජූනි 01 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022ජූනි 28 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021දෙසැම්බර් 31 දිනට මැතිවරණ කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

-----------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

**(අ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව අත්තිකාරම් ගෙවීම් රු.29,414,313 වුවත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එය රු.29,279,986 ක් ලෙස සටහන් කිරීම හේතුවෙන්මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ මුළු වියදම රු.134,327 ක් අඩුවෙන් දැක්වුනි. | රු.134,327 ක් වූ ණය ශේෂය 2021 නොවැම්බර් මස පියවීමට කටයුතු කර ඇතත් එය සිගාස් වැඩසටහනට ඇතුලත් කිරීමේදී වැරදීමකින් මැතිවරණ කොමසාරිස් ජනරාල්ගේ (ශීර්ෂ අංක 020) ශීර්ෂයටම බැර වීම නිසා මෙම වෙනස ඇතිවී ඇත. මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ii) | 2021 නොවැම්බර් 26 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 දරන චක්‍රලේඛයේ 7.2 ඡේදය ප්‍රකාරව වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් වාර්තාකරන ආයතනය විසින් එකතු කරන ලද ආදායම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුලත් නොකළ යුතු අතර එම ආදායම අග්‍රිම සැසඳුම් ප්‍රකාශය තුල ගැලපීම් කළ යුතු වේ.එහෙත් කොමිෂන් සභාව විසින් රු.42,412,012 ක්වූ එම ආදායම් වෙනත් ප්‍රධාන ලෙජර ගිණුම් ලැබීම් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ගැලපීම් කර තිබුණි. | ඉදිරියේදී ගිණුම් සකස් කිරීමේදී එම වරද නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

**(ආ) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | කොමිෂන් සභාවේ වත්කම් ලේඛනයන් හා 2018 - 2021 වර්ෂවල අපහරණ වාර්තා අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේපළ පිරියත උපකරණ ශේෂය හා දේපළ පිරියත උපකරණ සංචිත ශේෂය රු.2,132,208,077 ක් වුවද, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ එම ශේෂයන්හි අගය රු.2,065,916,625 ක් ලෙස දක්වා තිබුණි. | භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ අංක SA-82 අනුව සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් ප්‍රකාශයේ ආයතනය විසින් දරන ලද වියදමට වඩා වැඩි අගයක් තාක්ෂණික දෝෂයක් නිසා උඩුගත වී ඇති බැවින් යන්ත්‍රෝපකරණ හා නොනිමි වැඩ යටතේ ඇතුලත් වී භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශයන්හි අගය වැඩියෙන් දක්වා ඇත. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ii) | දේපල පිරියත උපකරණවලපසුගිය වර්ෂයට අදාල මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දෙසැම්බර් 31 දිනට ශේෂය හා සමාලෝචිත වර්ෂයේ විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ආරම්භක ශේෂය අතර රු.8,209,745 ක වෙනසක් පැවතියද මේ පිළිබඳ කිසිදු තොරතුරක් මූල්‍ය ප්‍රකාශනයේ හෙළිදරව් කර නොතිබුණි. | මෙම වෙනස හඳුනාගත නොහැකි බැවින් තවදුරටත් සොයා බලා වාර්තා කිරීමට කටයුතු කරමි. | වෙනස හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (iii) | ඉකුත් වර්ෂයේ පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් වෙත නීත්‍යානුකූලව පවරන ලද පිරිවැය රු.2,254,375 ක්වූ වාහනය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ වාහන පිරිවැයෙන් ඉවත්කර නොතිබුණි. | පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත පවරන ලද අංක GA – 9490 දරන වාහනයේ පිරිවැය මේ වන විට ඉවත් කිරීමට කටයුතු කරමි. | වාහන පිරිවැය නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (iv) | කොමිෂන් සභාවට 2018 වර්ෂයේ නීත්‍යානුකූලව පවරාගෙන තිබුණු පිරිවැය රු.9,500,000 ක්වූ වාහනයක් සහ සමාලෝචිත වර්ෂයේ නීත්‍යානුකූලව පවරාගෙන තිබුණු පිරිවැය රු.22,380,000 ක්වූ වාහන 04 ක් සමාලෝචිත වර්ෂයේගිණුම්ගත කර නොතිබුණි. | වාර්තාවේ සඳහන් නීත්‍යානුකූලව කොමිෂන් සභාව වෙත පවරාගෙන ඇති වාහන මෙම වර්ෂයේ ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | වාහන පිරිවැය නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (v) | සමාලෝචිත වර්ෂය තුල කොමිෂන් සභාව විසින් වටිනාකම රු.60,050,000 ක්වූ කල් බදූ වාහන 10 ක් පවරාගෙන ඇති නමුත් එම වාහනවල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | පවරා ගන්නා ලද වාහන 10 මේ වන විට CIGAS වැඩසටහන මඟින් ගිණුම්ගත කිරීමට කටයුතු කරන ලදි. | වාහන පිරිවැය නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (vi) | කොමිෂන් සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි අයිතම 04 ක වත්කම් ලේඛණය අනුව වටිනාකම රු.151,213,675 ක් වුවද ඒවා රු.73,793,025 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉඩම් ගොඩනැගිලි තක්සේරු කළ පසු වත්කම් ලේඛණය යාවත්කාලීන නොවීම නිසා මෙම වෙනස ඇතිවී ඇත. නිවැරදි කිරීමට කටයුතු කරමි. | ඉඩම් හා ගොඩනැගිලි පිරිවැය නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (vii) | ගම්පහ දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් නිල නිවාසයේ රු.1,164,715 ක්වු වටිනාකම නිල නිවාස කාණ්ඩය යටතේ ගිණුම්ගත කර නොතිබුණු අතර ඉකුත් වර්ෂයේ කොමිෂන් සභාව වෙත පවරා ගත් පර්චස් 9.9 කින් යුතු මහනුවර දිස්ත්‍රික්කයේ ඉඩම හා යාපනය දිස්ත්‍රික් ලේකම්වරයා විසින් 2012 වර්ෂයේ පවරා දී තිබුණු ඉඩම් ගිණුම්ගත කර නොතිබුණි. | ගම්පහ නිල නිවසේ සහ මහනුවර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ගබඩාව හා සංචාරක බංගලාව සඳහා වෙන් කර ඇති ඉඩම තක්සේරු වාර්තාවක් ලබා ගැනීමට තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර තක්සේරු වටිනාකම ලද පසු එම වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කරමි.<br>යාපනය කර්යාල ගොඩනැගිල්ල ඉදිකරනු ලබන ඉඩම කොමිෂන් සභාව වෙත පවරා දීමට දිස්ත්‍රික් ලේකම්වරයා එකඟතාව පලකර ඇති නමුත් මෙම ඉඩම පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ඉඩමක් බැවින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් පැවරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. | ඉඩම් හා ගොඩනැගිලි පිරිවැය නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (viii) | සමාලෝචිත වර්ෂයේදී 2104 වැය විෂයය යටතේ යාපනය ගොඩනැගිලි සහ ඉදි කිරීම් වෙනුවෙන් දරා ඇති වියදම රු.20,000,000 ක් වුවත් සමාලෝචිත වර්ෂයේ නොනිමි වැඩ යටතේ එය රු.25,000,000 ක් ලෙස දක්වා තිබුණි. | යාපනය මැතිවරණ කාර්යාලය ඉදිකිරීම සඳහා දරන ලද රු.20,000,000 ක් වුවත් 2021.12.31 දිනට වත්කම් උඩුගත කිරීමේදී සිදු වී ඇති තාක්ෂණික දෝෂයක් නිසා රු.25,000,000 ක් ලෙස ප්‍රාග්ධනිත වී ඇත. නිවැරදි කිරීමට කටයුතු කරමි. | නොනිමි වැඩ නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ix) | සමාලෝචිත වර්ෂයේදී වැය විෂයය අංක 2103 හා 2102 යටතේ එකතුව රු.20,917,344 ක් ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ මිලදී ගැනීම සහ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සඳහා වැය කර තිබුණද, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ එය රු.37,178,580ක් ලෙස දක්වා තිබුණි. | 2021 වර්ෂයේ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වෙනුවෙන් පිළිවෙලින් 2102 හා 2103 වැය විෂයයන් යටතේ රු.20,032,050.00 ක් හා රු.885,294 ක් වැය කර ඇත. තාක්ෂණික දෝෂයක් නිසා සමාලෝචිත වර්ෂයේ රු.37,178,579.87 ක් ප්‍රාග්ධනිත වී ඇත. මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ මිලදී ගැනීම හා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (x) | වත්කම් අපහරණ ලේඛණය අනුව සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාව විසින් පිරිවැය රු.6,548,137 ක්වූ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අපහරණය කර තිබුණද එම වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | අපහරණය කරන ලද යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වටිනාකම මෙම වර්ෂයේදී යාවත්කාලීන කිරීමට කටයුතු කරමි. | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අපහරණය කිරීම නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

### 1.6.3 පොත් වලින් කපා හැරීම පිළිබඳ ප්‍රකාශය

**---------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | <u>විගණන නිරීක්ෂණය</u> | <u>ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම</u> | <u>නිර්දේශය</u> |
|---|---|---|---|
| **(අ)** | ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ පොත් වලින් කපා හැරීම පිළිබඳ ප්‍රකාශයේ දෙසැම්බර් 31 දිනට කපා නොහළ ඉදිරියට ගෙන යන ශේෂය ලෙස දක්වා තිබූ එකතුව රු.2,233,961 ක්වූ වාහන අනතුරු 6 ක් සම්බන්ධයෙන් වූ අලාභයන් 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පොත් වලින් කපාහැරීම් පිළිබඳ ප්‍රකාශයේ ආරම්භක කපා නොහළ ශේෂයන් ලෙස දක්වා නොතිබුණි. | අදාල අලාභයන් කපා හැරීම සඳහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලබාගෙන පොතෙන් අස්කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | ආරම්භක කපා නොහළ ශේෂයන් නිවැරදිව දැක්විය යුතුය. |
| **(ආ)** | කොමිෂන් සභාවේ එක් වාහනයකට අදාලව එකතුව රු.35,217 ක්වූ අලාභයන් සමාලෝචිත වර්ෂයේ පොත්වලින් කපා හැර තිබුණද ඒ පිළිබඳ විස්තර පොත්වලින් කපා හැරීම පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | රු.35,217 ක්වූ අලාභය පොත්වලින් කපා හැරීම පිළිබඳ ප්‍රකාශයේ දැක්විය යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 සීමා ඉක්මවීම්

---------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම සඳහා2020 අංක 07 දරන විසර්ජන පනතින් බලය දෙනු ලැබූ උපරිම හර ශේෂ සීමාව රු.85,000,000 ක් වුවත් තථ්‍ය උපරිම හර ශේෂය රු.100,974,010 ක් වූයෙන් උපරිම හර ශේෂ සීමා ඉක්මවීම රු.15,974,010 ක් විය. 2020 අංක 07 දරන විසර්ජන පනතේ 9 වන වගන්තිය අනුව උපරිම හර ශේෂ සීමාව සංශෝධනය සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගතයුතු වුවද 2022 මැයි31 දින දක්වා එවැනි අනුමැතියක් ලැබී නොතිබුණි. | 2020 අංක 07 දරන විසර්ජන පනතින් ගිණුම් අංක 02001 සඳහා බලය දෙනු ලැබූ උපරිම හර ශේෂ සීමාව රු.85,000,000 ක් වූ නමුත් මාගේ 2021දෙසැම්බර් 15 දිනැතිව ජනාධිපති ලේකම් කාර්යාලයට ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව අත්තිකාරම් ගිණුම් කටයුතුවල උපරිම හර ශේෂ සීමාව රු. 115,000,000 දක්වා සංශෝධනය කිරීම සඳහා නිර්දේශ කිරීමට කටයුතු කරන බව ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක BDA/AA/LR/01/2022 හා 2021 දෙසැම්බර් 31 දිනැති ලිපියෙන් දන්වා ඇත. | 2020 අංක 07 දරන විසර්ජන පනතේ 9 වන වගන්තිය අනුව උපරිම හර ශේෂ සීමාව සංශෝධනය සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වේ. |

### 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

--------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 264 | | 2020 මහ මැතිවරණයේ කොළඹ දිස්ත්‍රික්කයේ ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානයේ නාමපුවරු සකස් කිරීම සඳහා අවශ්‍ය ලී සහ අනෙකුත් අමුද්‍රව්‍ය සපයා ගැනීම වෙනුවෙන් සිදු කළ රු.124,110 ක්වූ ගෙවීමට අදාලව | මැතිවරණ සමයේ නිලධාරීන්ගේ කාර්ය බහුලත්වය නිසා අතපසුවීමකින් මෙම වරද සිදුවී ඇත.මේ වන විට මුද්දර යෙදූ කුවිතාන්සි ලබා ගෙන ඇති අතර ඉදිරියේදී මෙවැනි අඩුපාඩු ඇති නොවීමට නිලධාරීන් දැනුවත් කර ඇත. | මුදල් රෙගුලාසිප්‍ර කාරව කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | සහ ගම්පහ දිස්ත්‍රික්කයේ 2019 ජනාධිපතිවරණයේ ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානයක පරිශ්‍රයේ බිම සකස් කිරීම වෙනුවෙන් සිදු කළ රු.98,250 ක්වූ ගෙවීමට අදාලව නිසි පරිදි මුද්දර යෙදූ කුවිතාන්සි ලබාගෙන නොතිබුණි. | | |
| (ආ) | 2006 අංක 12 දරණ මුද්දර ගාස්තු විශේෂ (විධිවිධාන) පනත. | 2020 මහ මැතිවරණයට අදාලව ගෙවීම් කරන ලද රු.25,000 ට වැඩි වවුචර් 03 ක් සඳහා නියමිත වටිනාකම මත මුද්දර ගාස්තු අයකර දේශීය ආදායම් කොමසාරිස් වෙත යැවීම හෝ අදාල වටිනාකම ඇති මුද්දර ඇලවීම සිදු කර නොතිබුණි. | මැතිවරණ සමයේ නිලධාරීන්ගේ කාර්ය බහුලත්වය නිසා අතපසුවීමකින් මෙම වරද සිදුවී ඇත. ඉදිරියේදී මෙවැනි අඩුපාඩු ඇති නොවීමට නිලධාරීන් දැනුවත් කර ඇත. | 2006 අංක 12 දරණ මුද්දර ගාස්තු විශේෂ (විධිවිධාන) පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය. | සෑම මුදල් වර්ෂයකම අප්‍රේල් 30 දිනට පෙර විනාශ කළ යුතු, අලුත්වැඩියා කළ යුතු, විකිණිය යුතු හා වෙනත් රජයේ ආයතනවලට පැවරිය හැකි භාණ්ඩ සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කිරීමෙන් පසු ජුනි 15 දිනට පෙර පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එලෙස පොදු 47 වාර්තාව අනුව | 2020 වර්ෂයට අදාල භාණ්ඩාගාර හා ගිණුම් පරීක්ෂක 66 වාර්තා 2021/3/30 වැනි දින විගණකාධිපති වෙත ඉදිරිපත් කල අතර ජුනි 15 දිනට පෙර ඉදිරිපත් කල යුතු වාර්තාව කොරෝනා වසංගතය නිසා<br><br>ඇතැම් මැතිවරණ කාර්යාල වසා තැබීමට සිදු වීම හේතුවෙන් මෙම ප්‍රමාදය ඇතිවූ බව දන්වමි. | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

කටයුතු කිරීමකින් තොරව භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඉදිරිපත් කර තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරික්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 පෙබරවාරි 10 දින පැවැත්වූ පළාත් පාලන මැතිවරණයේ වාර්තාව 2021 මාර්තු 31 දින වනවිට සකස් කර අවසන් කරන බව සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර තිබුණද, විගණිත දිනය වන විටත් එම වාර්තාවේ කටයුතු අවසන් කර නොතිබුණි. | මෙම වාර්තාව මුද්‍රණය කිරීම 2021 මාර්තු මස අවසන් කිරීමට 2021 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කලද වරින් වර ඇති වූ කොවිඩ් 19 පැතිර යාම සහ ඒ හේතුවෙන් කාර්යාල වසා තැබීම මෙන්ම කාර්ය මණ්ඩලය අඩු කර කාර්යාල පවත්වාගෙන යාම වැනි නොවැළැක්විය හැකි හේතුන් මත මෙම කාර්යය අවසන් කිරීමට නොහැකි විය. | පළාත් පාලන මැතිවරණයේ වාර්තාවේ කටයුතු කඩිනමින් අවසන් කළ යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ විශේෂ ව්‍යාපෘති ඒකකය යටතේ සමාලෝචිත වර්ෂයේ සිදු කිරීමට සැලසුම් කර තිබුණු ප්‍රධාන කාර්යන් 05ක් සිදුකර නොතිබුණි. | 2021 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබූ ව්‍යාපෘති සම්බන්ධයෙන් කටයුතු කිරීම වරින් වර ඇති වූ කොවිඩ් 19 පැතිර යාම සහ ඒ හේතුවෙන් කාර්යාල වසා තැබීම මෙන්ම අවම කාර්ය මණ්ඩලයක් පවත්වාගෙන යාම වැනි නොවැළැක්විය හැකි හේතුන් මත ඉදිරියට පවත්වාගෙන යාමට නොහැකි විය. | ක්‍රියාකාරී සැලැස්මේ සැලසුම්ගත කාර්යයන් ඉටු කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 3.2 ප්‍රසම්පාදනයන්

-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පාර්ලිමේන්තු මහ මැතිවරණයේ මාතර සුජාතා විද්‍යාලයේ ගොඩනැගිලි නවීකරණ කටයුතු ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 පරිදි අනුමත සමිතියක් වන පාසැල් සංවර්ධන සමිතියකින් සිදු කර ගැනීමට තීරණය කර තිබූ නමුත් එකී තීරණයට පටහැනිව රු.1,325,654 ක අළුත්වැඩියා කටයුතු අනුමත නැති වෙනත් සමිතියක් මඟින් සිදුකරගෙන තිබුණි. | සුජාතා විද්‍යාලයේ පාසල් සංවර්ධන සමිතිය මගින් අදාල නවීකරණයන් සිදුකිරීමට විදුහල්පතිනිය එකඟ නොවූ බැවින් නැවත ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කර වැලිවේරිය නැගෙනහිර ග්‍රාම සංවර්ධන සමිතිය මගින් ඉටුකර ගෙන ඇත. | මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 පරිදි කටයුතු සිදු කළ යුතු වීම. |
| (ආ) | මැතිවරණ කොමිෂන් සභාවේ අංක S/7 (1) දරණ චක්‍රලේඛය ප්‍රකාරව රු.1,000,000 ඉක්මවන ප්‍රසම්පාදන, ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය සමඟ ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කර කොමිෂන් සභා කමිටුවේ අනුමැතියට ඉදිරිපත් කළ යුතු වුවත්,රු.4,593,436 ක්වූ මාතර දිස්ත්‍රික් ප්‍රධාන ගණන් කිරීමේ මධ්‍යස්ථානවල නවීකරණය කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා එලෙස අනුමැතිය ලබා ගෙන නොතිබුණි. තවද මෙම කොන්ත්‍රාත්තු වලදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 පරිදි විධිමත් ප්‍රතිග්‍රහන ලිපි නිකුත් කර නොතිබුණු අතර ලිඛිත ගිවිසුම්ද ඇති කරගෙන නොතිබුණි. | අනුමැතිය සඳහන් ලිපිය ප්‍රධාන කාර්යාලයට 2020.07.22 දින යොමු කර ඇත. | S/7 (1) දරණ චක්‍රලේඛය ප්‍රකාරවකටයුතු කළ යුතු වීම හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 පරිදි කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | ලංසු ආරාධනා ලේඛනයේ අවසන් පරිච්ඡේදය පරිදි මිල ගණන් ප්‍රසම්පාදන මණ්ඩලය පිළිගනු ලැබුවහොත්, සැපයුම්කරු විසින් සහකාර තේරීම්භාර නිලධාරී සමඟ ගිවිසුමක් අත්සන් කළ යුතු වුවත්,මාතර දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මැතිවරණ කටයුතු සඳහා ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට | පිළිතුරු ලබාදී නැත. | ලංසු ආරාධනා ලේඛනයේ අවසන් පරිච්ඡේදය පරිදිසැපයුම්කරු විසින් සහකාර තේරීම්භාර නිලධාරී සමඟගිවිසුම්ගත |

| | | | |
|---|---|---|---|
| | ලබා ගැනීමට අදාලව සිදු කළ ප්‍රසම්පාදනයේදී අදාල සැපයුම්කරු විසින් එලෙස ගිවිසුම්ගත බැඳීමක් ඇතිකරගෙන තිබුණි. | | බැඳීමක් ඇතිකරගත යුතු වේ. |
| **(ඇ)** | 2020 මාර්තු 11 අංකS/1 (1) දරන කොමිෂන් සභා චක්‍රලේඛයේ (2) ඡේදය ප්‍රකාරව ඡන්ද විමසීමට අදාලව දිස්ත්‍රික් කාර්යාල විසින් සකස් කරනු ලබන ඇස්තමේන්තු ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු වුවත් කොළඹ දිස්ත්‍රික්කයේ රාජකීය විද්‍යාලයේ ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානයේ අත්‍යාවශ්‍ය නවීකරණ හා නඩත්තු කටයුතු සඳහා පන්ති කාමර අළුත්වැඩියා සහ තාවකාලික බෙදුම් කොටස් සකස් කිරිමේ ප්‍රසම්පාදනයන්ට අදාලව සකස් කරන ලද කිසිදු ඇස්තමේන්තුවකට ප්‍රධාන කාර්යාලයේ අනුමැතියක් ලබාගෙන නොතිබුණි. තවද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.2 ඡේදය ප්‍රකාරව රුපියල් මිලියන 100 නොඉක්මවන මෙම ප්‍රසම්පාදනයන්වල මුළු පිරිවැය ඇස්තමේන්තු දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අනුමැතියට ඉදිරිපත් කර නොතිබුණි. | මෙම කාර්යයන් 03 එකිනෙකට ස්වායක්තව සිදු කරන ලද කාර්යයන් 03 කි. එකිනෙකට ස්වායක්තව ගත් කල මෙහි ප්‍රසම්පාදන සීමාව රු.1,500,000 කට වැඩි නොවේ. එම නිසා ප්‍රධාන කාර්යාලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර නැත. මෙම කාර්යයන් සියල්ල එකම අවස්ථාවක සිදු කිරීමට යෝජිතව නොතිබූ අතර ඉතා හදිසියේ සිදු වූ ප්‍රසම්පාදන කාර්යයන් වේ. එම නිසා එම කාර්යයන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගෙන් අනුමැතිය ලබා ගැනීමට නොහැකි විය. | අංකS/1 (1) දරන කොමිෂන් සභා චක්‍රලේඛයේ (2) ඡේදයට අනුගතව කටයුතු කළයුතු වීම. |
| **(ඉ)** | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(ආ) ඡේදය ප්‍රකාරව රු.250,000 ඉක්මවන භාණ්ඩ හා සේවා කොන්ත්‍රාත් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කළ යුතු වුවත් කොන්ත්‍රාත් වටිනාකම රු.250,000 ඉක්මවා තිබුණු 2020 මහ මැතිවරණයේ කොළඹ දිස්ත්‍රික්කයේ ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානවල අත්‍යාවශ්‍ය නවීකරණ හා නඩත්තු කටයුතු සිදුකිරීමේ එකතුව රු.3,043,146 ක්වූ ප්‍රසම්පාදන කටයුතු 03ක එලෙස කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8:9:1 (ආ) ඡේදය ප්‍රකාරව සෑම ප්‍රසම්පාදන ක්‍රියාවක් සම්බන්ධයෙන්ම කොන්ත්‍රාත්කරු සමඟ ලිඛිත ගිවිසුමකට ඇතුළත් වී ඇත. අදාළ ගිවිසුම් වෙනම ගොනුවක ගොනුකර ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(ආ) ඡේදය ප්‍රකාරව රු.250,000 ඉක්මවන භාණ්ඩ හා සේවා කොන්ත්‍රාත් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.7.1(ආ) ඡේදය ප්‍රකාරව ලංසුවේ වලංගු කාලය ඇතුළත සහ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම පිළිබඳ අවසාන තීරණය ගනු ලබූ විගස ප්‍රතිග්‍රාහන ලිපිය නිකුත් කළ යුතු වුවත්, 2020 මහ මැතිවරණයේ කොළඹ දිස්ත්‍රික්කයේ ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානවල අත්‍යාවශ්‍ය නවීකරණ හා නඩත්තු කටයුතු සිදුකිරීමේ ප්‍රසම්පාදන කටයුතු 04ක් සම්බන්ධයෙන් එම විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. | ප්‍රසම්පාදන තීරණයෙන් පසුව ලංසුකරුවන්ට ප්‍රතිග්‍රහණ ලිපි නිකුත් කර තිබුණි. කොන්ත්‍රාත්කරුවන්ට නිකුත් කරන ලද ප්‍රතිග්‍රහණ ලිපි වෙනම ගොනුවක ඇතුළත් කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.7.1(ආ) ඡේදය ප්‍රකාරව ලංසුවේ වලංගු කාලය ඇතුළත සහ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම පිළිබඳ අවසාන තීරණය ගනු ලැබූ විගස ප්‍රතිග්‍රාහන ලිපිය නිකුත් කළ යුතු වීම. |
| (උ) | 2020 මහ මැතිවරණයේ කොළඹ දිස්ත්‍රික්කයේ ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානයක නවීකරණ හා නඩත්තු කටයුතු සිදුකිරීමේ ප්‍රසම්පාදනයට අදාලව සකස් කරන ලද ඇස්තමේන්තුවට පරිබාහිරව සිදු කළ කාර්යයන් 05ක් සඳහා කිසිදු ලිඛිත අනුමැතියකින් තොරව රු.169,278ක් ගෙවා තිබුණි. | මැතිවරණය සඳහා රාජකීය විද්‍යාලය සඳහා තෝරාගත් පන්ති කාමර හා මූලික සැලැස්ම වරින්වර ගත් තීරණයන් හේතුවෙන් සංශෝධනය විය. මේ හේතුවෙන් මූලික ඇස්තමේන්තුවේ ඇතුළත් සමහර අයිතම නොකර සිටීමටත් පරිභාහිර කාර්යයන් එම ඉතිරිකිරීම් භාවිතයෙන් සිදු කිරීමටත් සිදු විය. තව ද මැතිවරණයෙන් අනතුරුව පාසැල් ගොඩනැගිලි හා දේපළ වලට සිදු වී තිබූ හානි පිළිසකර කිරීමට ද සිදු වූ බැවින් ඒ සඳහා අවස්ථානුකූලව කටයුතු යෙදීමට සිදු විය. | ඇස්තමේන්තුවට පරිබාහිරව සිදු කළ කාර්යයන් සඳහා අනුමැතියක් ලබාගෙන ගෙවීම් කළ යුතු වීම. |
| (ඌ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.3(ආ) ඡේදය ප්‍රකාරව අවිනිශ්චිත ප්‍රතිපාදන ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් මුදලින් සියයට 10 නොඉක්මවිය යුතුය. එසේවුවද 2020 මහ මැතිවරණයට අදාල කොළඹ රාජකීය විද්‍යාලය හා කොළඹ ඉසිපතන විද්‍යාලයේ ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානවල අත්‍යාවශ්‍ය නවීකරණ හා නඩත්තු කටයුතු සිදුකිරීමේ ප්‍රසම්පාදනයේදී රු.112,740 ක් වූ අවිනිශ්චිත | මැතිවරණයෙන් අනතුරුව ඉතා කෙටි කාලයක් තුළ පාසල් ගොඩනැගිලි භාරදිය යුතු වූ බැවින්, ඇස්තමේන්තු සඳහා අනුමැතිය ලබා ගැනීම මගහැරී ඇත. මෙම වරද නැවත ඇති නොවීමට අදාළ නිලධාරීන් දැනුවත් කරන ලදී. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.3(ආ) ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රතිපාදන ඉක්මවා සිදුකළ ඇස්තමේන්තුගත කාර්යයන් 19 කට ආදාලව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 ප්‍රකාරව අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර රු.96,185 ක්වූ ඇස්තමේන්තුගත කාර්යයන් 4ක් සම්පූර්ණයෙන්ම සිදු කර නොතිබුණි. | | |
| (එ) | කොළඹ දිස්ත්‍රික්කයේ ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානවල රථගාල් සඳහා යොදාගන්නා ස්ථානවල අත්‍යාවශ්‍ය හා තාවකාලික ඉදිකිරීම් සිදුකිරීමේ ප්‍රසම්පාදනයේදී රු. 190,805ක්වූ අවම මිල පදනම්කරගෙන සැපයුම්කරුවකු තෝරාගෙන තිබුණද, මෙම කොන්ත්‍රාත්තුව සඳහා එම සැපයුම්කරු වෙත රු.208,619ක් ගෙවා තිබුණි. ඒ අනුව එම ගෙවූ වටිනාකම අනෙක් ලංසුකරුවන් දෙදෙනා ඉදිරිපත්කල මිලට වඩා වැඩි වටිනාකමක් වූයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1(අ) ඡේදය කෙරෙහි මෙහිදී අවධානය යොමුවී නොතිබුණි. | මැතිවරණය සඳහා රාජකීය විද්‍යාලය තෝරාගත් පන්තිකාමර හා මූලික සැලැස්ම වරින් වර ගත් තීරණයන් හේතුවෙන් සංශෝධනය විය. මේ හේතුවෙන් මූලික ඇස්තමේන්තුවේ ඇතුළත් සමහර අයිතම නොකර සිටීමටත් පරිහාහිර කාර්යයන් එම ඉතිරිකිරීම් භාවිතයෙන් සිදු කිරීමටත් සිදු විය. මෙසේ වැඩි මුදලක් ගෙවීමට සිදු වූයේ මූලික ඇස්තමේන්තුවේ මුදලට පරිහාහිරව සිදු වූ වැඩ ප්‍රමාණය සඳහාය. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1(අ) ඡේදය කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ. |
| (ඒ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 ඡේදය ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තුව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් පිළියෙල කළ යුතු වුවත් ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රධාන ගණන් කිරීමේ මධ්‍යස්ථානවල තාවකාලික මඩු ඉදිකිරීමේ ප්‍රසම්පාදනයේදී සිදු කළ යුතු වැඩවල ලැයිස්තුවක් පමණක් සකස් කර තිබුණු අතර මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණි. | ඉදිරි ප්‍රසම්පාදන කටයුතු වලදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නිසි අනුමැතිය ලබා ගන්නා ලෙස දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල දැනුවත් කර ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඔ) | 2020 මාර්තු 11 දිනැති අංක S/7 (1) දරන කොමිෂන් සභා චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව ඡන්ද විමසීමට අදාලව සිදු කරන ප්‍රසම්පාදන සඳහා මිල ගණන් කැඳවීමේදී වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය භාවිතා කර එහිදි අවම වශයෙන් මිල ගණන් 5 ක් වත් | වෙළඳපළ මිල සැඳහුම් ක්‍රමය භාවිතයේදී අවම වශයෙන් මිල ගණන් 5ක් වත් ලබා ගත යුතු බවට නිලධාරීන් දැනුවත් කර ඇත. | 2020 මාර්තු 11 දිනැති අංක S/7 (1) දරන කොමිෂන් සභා චක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු |

| | | | |
|---|---|---|---|
| | ලබා ගත යුතු බව සඳහන් වුවද, 2019 ජනාධිපතිවරණයේ ගම්පහ දිස්ත්‍රික්කයේ ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානවල තාවකාලික ඉදිකිරීම් ප්‍රසම්පාදන 02 කදී එපරිදි කටයුතු කර නොතිබුණි. | | වේ. |
| (ඕ) | 2019 ජනාධිපතිවරණයේ ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස යොදා ගත් පත්තලගෙදර සියනෑ අධ්‍යාපන විද්‍යාපීඨ පරිශ්‍රයේ බිම සකස් කිරීමේ ප්‍රසම්පාදනය සඳහා ඉදිරිපත් වූ මිල ගණන් 03 අතුරින් අවම මිල පදනම් කර ගනිමින් එක් සැපයුම්කරුවකු තෝරාගෙන තිබුණු අතර තාක්ෂණික ඇගයීම් කමිටුවේ හෝ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව ප්‍රසම්පාදනවලදී තාක්ෂණික ඇගයීම් කමිටු ප්‍රසම්පාදන කමිටුවල අනුමැතිය නිසි පරිදි ලබා ගන්නා ලෙස දිස්ත්‍රික් සහකාර හා නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරු දැනුවත් කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව ප්‍රසම්පාදනවලදී තාක්ෂණික ඇගයීම් කමිටු ප්‍රසම්පාදන කමිටුවල අනුමැතිය ලබා ගත යුතු වේ. |

**3.3 වත්කම් කළමනාකරණය**

**----------------------------**

| <u>**විගණන නිරීක්ෂණය**</u> | <u>**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**</u> | <u>**නිර්දේශය**</u> |
|---|---|---|
| මහනුවර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ඡන්ද පෙට්ටි 25ක හා පරිගණක 5ක ඌණතාවයක් පැවති අතර දිස්ත්‍රික්කයට අයත් නොවන ඡන්ද පෙට්ටි 07ක් ද පැවතුණි. | අලුත්වැඩියා කටයුතු සඳහා රජයේ කර්මාන්ත ශාලාවට භාර දීමෙන් පසුව අලුත්වැඩියා කළ නොහැකිව විනාශ කිරීමට කටයුතු කරන ලද ඡන්ද පෙට්ටි පිළිබඳව අදාළ පොත්වල යාවත්කාලීන වී නොමැති නිසා මෙම දෝෂය සිදු වී ඇති බව පෙනී යන අතර, මෙම ඡන්ද පෙට්ටි පිළිබඳව භෞතිකව පරීක්ෂා කර බලා කටයුතු කරන ලෙස 2021 භාණ්ඩ සමීක්ෂණයෙන් පසු උපදෙස් ලබා දී ඇත. | භාණ්ඩ සමීක්ෂණයේ නිර්දේශ අනුව කටයුතු කළ යුතු වීම. |

## 3.4 කළමනාකරණ දුර්වලතා

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොමිෂන් සභාව විසින් ප්‍රධාන කාර්යාලයට යාබදව පිහිටිකොමිෂන් සභාවට අයත් නොවන ඉඩමක රු.1,771,701 ක් වැය කර ගොඩනැගිල්ලක් ඉදි කර තිබුණු අතරවිගණිත දින වන විටත් එම ඉඩමේ අයිතිය කොමිෂන් සභාව වෙත පවරාගෙන නොතිබුණි. | මෙම ඉඩම මැතිවරණ කොමිෂන් සභාවට පවරා ගැනීමේ කටයුතු අවසන් අදියරට පැමිණ ඇත.මෙම ගොඩනැගිල්ලේ, දැනට අබලි ද්‍රව්‍ය සහ ඡන්ද පෙට්ටි ගබඩා කිරීමට ක්‍රියාකර ඇත. | ඉඩමේ අයිතිය කොමිෂන් සභාව වෙත පවරාගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 2018 හා 2019 වර්ෂවල සිට පැවත එන එකතුව රු.122,900 ක්වූ වාහනවලට සිදුවූ අලාභ සම්බන්ධයෙන් 2021 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | 2018 හා 2019 වර්ෂවල අනතුරුවලට අදාළව වාහනවල අලාභය පොතෙන් කපා හැරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. | වාහනවලට සිදුවූ අලාභ සම්බන්ධයෙන්මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | 2020 වර්ෂයේ කැබ් රථයකට සිදුවූ රු.2,075,845 ක්වූ අලාභය සම්බන්ධයෙන් 2022 මාර්තු 21 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු පරීක්ෂණ අවසන් වී තවමත් නිර්දේශ ලබා දී නොමැත. එම කටයුතු අවසන් වී අදාළ වාර්තා ලද පසු ඉදිරි කටයුතු කඩිනමින් අවසන් කිරීමට ක්‍රියා කෙරේ. | වාහනවලට සිදුවූ අලාභ සම්බන්ධයෙන්මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 9 ක්, තෘතීයික මට්ටමේ තනතුරු 5 ක්, ද්විතීයික මට්ටමේ තනතුරු 37 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 14 ක පුරප්පාඩු පැවතුනි. | පවතින පුරප්පාඩු පිරවීම සඳහා අවස්ථා ගණනාවකදීම අදාළ බලධාරීන් දැනුවත් කර ඇත. | තනතුරු පුරප්පාඩු පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. |